ලංකා පිහන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 අහිතකර විගණන මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්බව හේතුවෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලංකා පිහන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොමැති බව මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

2012 ජනවාරි 01 වන දින සිට ක්‍රියාත්මක වන නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පාදක කර සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 ජූලි සිට 2012 මාර්තු දක්වා වූ කාල සීමාවට අදාල සංස්ථාව විසින් ගෙවිය යුතුව තිබූ සේවක අර්ථ සාධක අරමුදලේ දායකය වූ රු.44,876,863 ක් රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබූ නමුත් එය ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සේවයෙන් විශ්‍රාම ගිය නිලධාරීන් 497 ක් වෙනුවෙන් සංස්ථාව විසින් ගෙවිය යුතු පාරිතෝෂික මුදල, හිඟ වැටුප්, හිඟ ජීවන වියදම් දීමනාව සහ ස්වෙච්ඡා විශ්‍රාම ගැන්වීම මත ගෙවිය යුතු වන්දි මුදල වූ රු.326,936,590 ක් රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබූ නමුදු එය ගිණුම් ගතකර නොතිබුණි.

(ඇ) ඉතිරිව සිටින සේවකයින් 43 ක් වෙනුවෙන් 2012 දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික වෙන්කිරීම රු.5,755,597 ක් විය යුතු වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.69,859,212 ක් වෙන්කර තිබුණි. ඒ අනුව රු.64,103,615 ක අධි වෙන්කිරීමක් කර තිබුණි.

(ඈ) 2012 දෙසැම්බර් 31 දිනට පළුදු වූ තොගය වන රු.3,672,362 ක් සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඉ) ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණු ස්ථාවර තැන්පතු වටිනාකම රු.182,739 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) ආදායම් ප්‍රකාශයේ වෙනත් ආදායම් යටතේ දක්වා තිබුණු සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර තැන්පතු පොළී ආදායම හා ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළී ආදායම රු.169,828 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයට අදාල වාර්ෂික අවසන් තොග සමීක්ෂණයේදී රු.1,421,951 ක තොග අතිරික්තයක් හා රු.63,169 ක තොග ඌණතාවයක් පැවතුණද ඒ සඳහා වූ ගැලපීම් කර නොතිබුණි.

(ඌ) 2002 වර්ෂයේ විකුණා දමා තිබූ බංගදෙනිය කර්මාන්තශාලාවට අයත් රු.744,166 ක තොගයක් හා අවුරුදු 25 කට පෙර වසා දමා තිබූ ඔඩ්ඩුසුඩාන් කර්මාන්තශාලාවට අයත් රු. 1,006,483 ක තොගයක් මූල්‍ය ප්‍රකාශනවල අවසන් තොග ලෙස දක්වා තිබුණි.

1.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

-----------------------------------

ස්ථාවර වත්කම් ලේඛනයෙහි ඇතුලත් රු.1,345,063 ක් වටිනා වාහන 24 ක් භෞතිකව මණ්ඩල පරිශ්‍රයේ නොතිබුණු අතර මණ්ඩලය භාවිතයේ පවතින වාහන 13 ක වටිනාකම් ස්ථාවර වත්කම් ලේඛනයේ මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් වී නොතිබුණි.

1.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2002 වර්ෂය තුල වසා දමන ලද සමාගමක් වෙනුවෙන් 2012 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයගැතියන් හා වෙළඳ ණයහිමියන් වශයෙන් පිළිවෙලින් රු.22,375,918 ක් හා රු.48,602,070 ක ශේෂයන් තිබුණද ඒවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මහියංගනය කම්හලේ 2009 වර්ෂයට පෙර සිට පැවත එන නොපියවන ලද රු.220,463 ක් වූ ජල බිල්පත සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් පියවා නොතිබුණි.

(ඇ) බංගදෙණිය කම්හල

(i) ඉහත කම්හල වසර 10 කට පෙර සිට වසා දමා තිබුණු නමුත් ඉදිරියට ගෙනැවිත් තිබූ වෙළඳ ණයගැති ශේෂය වන රු.314,360 සහ ගෙවිය යුතු විදුලිය රු.1,058,182 සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) 2008 වර්ෂයේ සිටම පැවත එන ආරක්ෂක බදු, පිරිවැටුම් බදු, එකතු කළ අගය මත බදු හා භාණ්ඩ හා සේවා බදු වශයෙන් එකතුව රු.13,363,261 ක් වෙනත් ණයහිමි ගිණුමට බැර කර තිබුණු අතර ඒවා නිරවුල් කිරීමට 2013 සැප්තැම්බර් අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඈ) අවුරුදු 25 ක කාලයක සිට පැවත එන ඔඩ්ඩුසුඩාන් කර්මාන්තශාලාවට අයත් රු.167,222 ක් වූ වෙළඳ ණයගැති ශේෂයක් හා අයකර ගත යුතු රු.262,167 ක උත්සව අත්තිකාරම් මුදලක් නිරවුල් වී නොතිබුණි.

(ඉ) ඇලයාපත්තුව කම්හලට 2008 වර්ෂයට පෙර සිටම පෞද්ගලික ආයතනයකින් අයවිය යුතු රු.844,622 ක් වූ මුදල 2013 සැප්තැම්බර් අවසන් වනවිටත් අයකර ගෙන නොතිබුණි.

1.2.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

සමාලෝචිත වර්ෂය තුලදී දැයට කිරුල ප්‍රදර්ශනය වෙනුවෙන් මණ්ඩලය විසින් වැයකර තිබූ රු.3,129,246 ක් වූ මුදල සඳහා අදාල උපයෝගී ලියවිලි ඉදිරිපත් නොවීම නිසා එකී වියදම් විගණනයේදී සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

1.2.6 නීතී,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති,රීති,රෙගුලාසි ආදියට යොමුව | වටිනාකම<br>රු. | විස්තර |
|---|---|---|---|
| (අ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3 ඡේදය | 50,000 | ප්‍රෝටස් තිසේරා සැමරුම සඳහා සමාලෝචිත වර්ෂයේදී පුත්තලම් දිස්ත්‍රික් පදනමට රු.50,000 ක පරිත්‍යාගයක් සිදුකර තිබුණද, ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ආ) | 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත | 5,056,579 | දීර්ඝ කාලයක සිට ඉදිරියට ගෙන එමින් පවතින එකතුව රු.171,994,557 ක් වූ බදු මුදල් 2012 දෙසැම්බර් 31 දින වන විටත් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ඇ) | 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත | 55,809,968 | |
| (ඈ) | 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත | 11,002,254 | |
| (ඉ) | 1995 අංක 36 දරන ජාතික ආරක්ෂක බදු පනත | 38,406,286 | |
| (ඊ) | 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත | 59,488,624 | |

| | | | |
|---|---|---|---|
| (උ) | 2006 අංක 10 දරන ආදායම් බදු පනත | 2,230,846 | |
| (ඌ) | 1990 අංක 6 දරන බස්නාහිර පළාතේ මුදල් ප්‍රඥප්තිය | 5,583,755 | බස්නාහිර පළාත් ආදායම් කොමසාරිස්වරයා වෙත ප්‍රේෂණය කල යුතු රු.5,585,755 ක් වූ ව්‍යාපාර පිරිවැටුම් බදු 2012 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රේෂණය කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.5,149,861 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.104,172,501 ක් විය. මේ අනුව, සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 109,322,362 ක සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබුණි.

2.2 විග්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ වෙනත් ආදායම් ඉහල යාමට ප්‍රධාන වශයෙන් මහියංගනය හා බංගදෙනිය කම්හල් වල සුන්බුන් විකිණීමෙන් ලද රු.10,608,298 ක ආදායම් බලපා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ සේවකයින් 497 ක් සේවයෙන් විශ්‍රාම ගැන්වීම සහ කැලි පදනම මත නිෂ්පාදන කටයුතු කරගෙන යාම හේතුවෙන් විකුණුම් පිරිවැය සහ මුළු වියදම් පිළිවෙලින් සියයට 50 කින් හා සියයට 41 කින් අඩු වීමට බලපා තිබුණි.

(ආ) මණ්ඩලය 2011 වර්ෂය දක්වාම අඛණ්ඩව අලාභ ලැබුවද 2012 වර්ෂයේදී කරනු ලැබූ ප්‍රතිසංස්කරණ හේතුවෙන් ලාභ ලබමින් පවතින බව නිරීක්ෂණය විය.

| වර්ෂය | 2012 | 2011 | 2010 | 2009 | 2008 | 2007 |
|---|---|---|---|---|---|---|
| ලාභය/(පාඩුව) (රු.මිලියන ) | 5.1 | (104.2) | (77.3) | (63) | (42.9) | (20.4) |

## 2.3 මූල්‍ය අනුපාත විග්‍රහය

| | 2012 | 2011 | නිරීක්ෂණ |
|---|---|---|---|
| ජංගම අනුපාතය | 0.30 | 0.26 | සුරක්ෂිත ආයතනයක සම්මත ජංගම අනුපාතය 2:1 ක් විය යුතුය. |
| ණය අනුපාත | 2.66 | 3.12 | ව්‍යාපාර ආයතනයක පැවතිය යුතු සම්මත මුළු වත්කම් වලට බාහිර ණය අනුපාතය 1:1 ක් විය යුතුය. අධිතෝලන අනුපාතයක පෙන්වන බැවින් සංස්ථාවේ පැවැත්මට අහිතකර ලෙස බලනොපානු ඇතැයි යන්න බැහැර කළ නොහැකි විය. |
| ණයගැති පිරිවැටුම් අනුපාතය | 1.43 | 4.01 | ණයගැතියන්ගෙන් මුදල් අයකර ගැනීම් කාලය දින 91 සිට දින 255 දක්වා වැඩිවී තිබුණි. |
| ණයගැති පිරිවැටුම් දින ගණන | දින 255 | දින 91 | |
| තොග පිරිවැටුම් අනුපාතය | 4.04 | 4.73 | නිෂ්පාදිත තොගය විකුණුම් බවට පත්වීමට ගතවන කාලය දින 77 සිට දින 90 දක්වා වැඩිවී තිබුණි . |
| ණයගැති පිරිවැටුම් දින ගණන | දින 90 | දින 77 | |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මණ්ඩලයට අයත් නිෂ්පාදන කටයුතු පවත්වාගෙන යන උළු කර්මාන්තශාලා 07 ක් පවත්නා අතර සමාලෝචිත වර්ෂය තුලදී ඉන් කර්මාන්තශාලා 05 ක් පාඩු ලබා තිබුණි. පසුගිය වර්ෂ 5 තුල ඒවායේ ලාභාලාභ තත්ත්වය පහත පරිදි විය.

| උළු කර්මාන්තශාලාව | වර්ෂය සඳහා ලාභය / ( පාඩුව) | | | | |
|---|---|---|---|---|---|
| | 2012 | 2011 | 2010 | 2009 | 2008 |
| | රු. | රු. | රු. | රු. | රු. |
| වෑ උඩ | (1,989,600) | (11,061,586) | (11,063,102) | (18,592,538) | (18,451,900) |
| ඇලයාපත්තුව | (12,068,069) | (29,414,618) | (20,687,770) | (25,454,863) | (18,522,562) |
| බිංගිරිය | (1,711,014) | (6,837,118) | (7,468,051) | (7,387,301) | (5,655,707) |
| මහියංගනය | 3,978,017 | (20,981,620) | (15,457,782) | (12,389,294) | (14,104,148) |
| යටියන | (4,751,744) | (14,382,036) | (12,071,994) | 12,260,587 | (11,365,675) |
| උස්වැව | (8,985,412) | (17,127,924) | (13,800,090) | (14,171,282) | (10,592,693) |
| ඒරගම | 22,720,384 | (4,148,425) | 3,825,335 | 20,504,151 | 26,311,561 |

(ආ) සමාලෝචිත වර්ෂය තුල මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කර්මාන්තශාලා 5 හි නිෂ්පාදනය කිරීමට ඇස්තමේන්තු කළ උළු , ගඩොල් හා සෙසු ද්‍රව්‍ය ඒකක ගණන 9,573,366 ක් වූ නමුත් තථ්‍ය නිෂ්පාදන ඒකක ගණන 3,112,050 ක් හෙවත් ඇස්තමේන්තුගත නිෂ්පාදනයෙන් සියයට 33 ක් පමණක් විය. විස්තර පහත දැක්වේ.

| කර්මාන්තශාලාව | ඇස්තමේන්තු කළ නිෂ්පාදන ඒකක | තථ්‍ය නිෂ්පාදිත ඒකක | ඌණ නිෂ්පාදන ඒකක |
|---|---|---|---|
| ඒරගම | 3,544,902 | 1,515,803 | 2,029,099 |
| බිංගිරිය | 498,600 | 150,690 | 347,910 |
| මහියංගනය | 1,856,700 | 593,287 | 1,263,413 |
| උස්වැව | 2,148,264 | 418,989 | 1,729,275 |
| යටියන | 1,524,900 | 433,281 | 1,091,619 |
| එකතුව | 9,573,366 | 3,112,050 | 6,461,316 |

(ඈ) 2002 වර්ෂයේදී වසා දමා තිබුණු බංගදෙනිය උළු කර්මාන්ත ශාලාවට අයත් යන්ත්‍රෝපකරණ 2012 වර්ෂයේදී සුන්බුන් අගයට විකිණීමෙන් රු.7,957,298 ක ආදායමක් උපයා තිබුණි. කර්මාන්තශාලාවට අයත් ඉඩම රු.60,000 ක් වූ පොත් අගයකට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) සියළුම කර්මාන්තශාලා සඳහා උපරිම හා අවම තොග මට්ටම් කිසිවක් ස්ථාපිත කර නොතිබුණු අතර 2012 දෙසැම්බර් 31 දිනට රු.6,965,913 ක් වටිනා දර තොගයක් මණ්ඩලය සතුව ඉතිරිව තිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

මණ්ඩලයේ සේවයෙන් විශ්‍රාම ලබාගත් සේවකයින් විසින් ඔවුන්ගේ සේවය දීර්ඝ නොකිරීම හා හිඟ පාරිතෝෂික සම්බන්ධයෙන් මණ්ඩලයට එරෙහිව ඒ ඒ කම්හල් ආශ්‍රිත කම්කරු විනිශ්චය සභාවල හා විවිධ උසාවිවල ගොනු කර තිබූ නඩු සංඛ්‍යාව 10 ක් වූ අතර ඒවා ගිණුම්වලින් හෙළිදරව් කර නොතිබුණි.

3.3 හඳුනාගත් පාඩු

------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බිංගිරිය කම්හල් සේවයේ නියුතුව සිටි නිලධාරියකුට පාරිතෝෂික ගෙවීම් පනත ප්‍රකාර නියමිත දිනට පාරිතෝෂික මුදල් ගෙවීමට අපොහොසත් වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලය විසින් රු.57,039 ක අධිභාරයක් ගෙවා තිබුණි.

(ආ) සේවක අර්ථසාධක අරමුදල් පනත ප්‍රකාර නියමිත දිනට අර්ථසාධක අරමුදල් දායක මුදල් ගෙවීමට අපොහොසත් වීම හේතුවෙන් රු.1,700,000 ක අධිභාර මුදලක් මණ්ඩලයට ගෙවීමට සිදු වී තිබූ අතර 2013 සැප්තැම්බර් 30 දින වන විටත් එය ගෙවා නොතිබුණි.

(ඇ) පරිගණක ඒකාබද්ධ කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.29,000 ක මුදලක් ආයතනයේ මූල්‍ය කළමනාකාරිණිය හරහා පුද්ගලික සමාගමකට ගෙවා තිබුණද, එවැනි ඒකාබද්ධ කිරීමක් 2013 සැප්තැම්බර් 30 දින වන විටත් සිදුවී නොතිබුණි.

3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

-------------------------------------

මණ්ඩලයේ ශුද්ධ වත්කම් සෘණ අගයක් ගෙන තිබුණද, එය නොසලකා සමාලෝචිත වර්ෂයේදී රාජ්‍ය වතු ආයතනයකට රු.5,000,000 ක ණය මුදලක් ලබාදී තිබුණි.

3.5 මණ්ඩලයේ පැවැත්ම

--------------------------

මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම අවිනිශ්චිත බව පහත සාධක මගින් නිරීක්ෂණය විය.

(අ) මණ්ඩලයේ ශුද්ධ වත්කම් 2011 වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ පිළිවෙලින් රු.260,530,465 ක් හා රු.247,380,646 ක් වශයෙන් සෘණ අගයන් ගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ මණ්ඩලයේ මුළු වත්කම් වලට මුළු වගකීම් අනුපාතය 1:3 ක් වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයේ මුළු සේවක සංඛ්‍යාව 540 කින් සේවකයින් 497 ක් ස්වෙච්ඡා වන්දි ලබාදී සේවයෙන් විශ්‍රාම ගන්වා තිබුණි.

(ඇ) මණ්ඩලයට අයිතිව තිබූ කර්මාන්තශාලා 9 න් දැනට කර්මාන්තශාලා 7 ක් පමණක් නිෂ්පාදන කටයුතු පවත්වාගෙන යනු ලැබුවද ඉතිරි කර්මාන්තශාලා 2 පහත සඳහන් හේතු මත වසා දමා තිබුණි.

| කර්මාන්තශාලාව | වසා දැමූ වර්ෂය | වසා දැමීමට හේතුව |
|---|---|---|
| ඔඩ්ඩු සුඩාන් | 1982 | යුධ තත්ත්වය |
| බංගදෙනිය | 2002 | අමුද්‍රව්‍ය හිඟකම |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහ පාලනය

### 4.1 සංයුක්ත සැලැස්ම

මණ්ඩලය සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 4.2 ක්‍රියාකාරී සැලැස්ම

මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.

### 4.3 විගණන කමිටු

2006 අගොස්තු 28 දින අංක පීඑෆ්/එෆ්එස්/4(XII ) දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 2 වගන්තිය ප්‍රකාරව මණ්ඩලය තුළ විගණන කමිටු රැස්වීම් ක්‍රියාත්මක නොවන්නේ නම් වහාම එම කමිටු යථා පරිදි පත්කර ඒවා නිසිපරිදි රැස්වන බව තහවුරු කර එම කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීමට පසු විපරම් කිරීමටත් පියවර ගතයුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් එකී කමිටු පත්කිරීම කෙරෙහි මණ්ඩලයේ කළමණාකරණය කටයුතු කර නොතිබුණි.

4.4 ප්‍රසම්පාදන සැලැස්ම

---------------------------

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් මණ්ඩලය විසින් සකස්කර නොතිබුණි.

4.5 අයවැය ලේඛණමය පාලනය

-----------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා අයවැයක් සකස් කර නොතිබුණි. එහෙයින් අයවැය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගැනීම කෙරෙහි මණ්ඩලයේ අවධානය යොමුව නොතිබුණි.

5. පද්ධති හා පාලන

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර නිසි බලධාරියාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) වත්කම් උපයෝජනය

(ඇ) ණයගැති හා ණයහිමි පාලනය

(ඈ) සේවක මණ්ඩල කළමනාකරණය

(ඉ) නිෂ්පාදන ඉලක්ක ලඟාකර ගැනීම